# අපි කළු ද?

අප භාෂාව ගැන මෙතරම් කතා කරනුයේ අවසානයේ දී ප්‍රවාද හා සංකල්ප ප්‍රකාශ කෙරෙනුයේ ද භාෂාවක් මගින් වීම හේතුකොටගෙන ය. භාෂාවකට ඒ හැරෙන්නට වෙනත් කාර්යයන් ද ඇති බව අපට පඬිවරුන් අමුතුවෙන් කිව යුතු නොවේ. අප මෙහි දී අවධාරනය කරන්නේ භාෂාවකින් ප්‍රකාශ වන අදහස් ඒ ඒ භාෂාවට සාපේක්ෂ බව, හා ඒ ඒ භාෂාව ඒ ඒ සංස්කෘතියට සාපේක්ෂව නිර්මාණය වී ඇති බව ය. මේ සැම විට ම බටහිරයන් මෙන් ඌනිතවාදී නොවී සංස්කෘතිය ද යම් ප්‍රමාණයකට භාෂාවෙන් නිර්ණය වන බව ද අපි කියා සිටිමු. මිනිසා භාෂා නිර්මිතයක් ය යන්න ප්‍රතික්ෂෙප කරන අපි මිනිසා, භාෂාව හා සංස්කෘතිය අතර ඇති චක්‍රීය සම්බන්ධය අවධාරනය කරමු.

බොහෝ පැරණි සංස්කෘතින්වල චක්‍රීය සංකල්පය දැකගත හැකි ය. චීන සංස්කෘතියෙහි ද සියල්ල නැවත නැවත සිදුවන බව විශ්වාස කෙරෙයි. භාරතීය සංස්කෘතියෙහි චක්‍රීය සංකල්පය සංසාරය යන්නෙහි ද ඇත.ආර්යයන් (වෛදිකයන්) භාරතයට පැමිණීමට පෙර එහි තිබුණේ ද චක්‍රීය චින්තනයක් බව පැහැදිලි ය. සංසාරය යන සංකල්පය ප්‍රාග් වෛදික සංස්කෘතීන්හි තිබුණු බවට සැකයක් තිබිය හැකි නොවේ. ඒ සංකල්පය බටහිරන් පැමිණි ආර්යයන් විසින් ගෙනෙන ලද්දක් නොවේ. එයට හේතුවක් වනුයේ වෙනත් ආර්ය යැයි කියන සංස්කෘතීන්හි සංසාරය යන සංකල්පය දැකගත නොහැකි වීම ය. සංසාරය යන වචනයෙහි ද සංසරණය යන අදහස අඩංගු වෙයි. සංසරණය යන්නට ඉංගිරිසියෙන් circulation යැයි කියනු ලැබේ. එහෙත් circulation යනු දෙන ලද සංවෘත පථයක ද්‍රවයක් වැන්නක් නැවත නැවත ගමන් කිරීම ය. උදාහරණයක් ලෙස රුධිර සංසරණය ගත හැකි ය. රුධිර සංසරණය “සොයා ගත්තේ” බටහිරයන් යැයි ඔවුන් අපට ඉගැන්වුව ද ඒ පිළිබඳ දැනුමක් අවුරුදු දහස් ගණනකට පෙර ද භාරතීයයනට තිබී ඇත. භාරතයෙන් බටහිරට ගිය රුධිර සංසරණ දැනුම එහි දී ඔවුන්ගේ (බටහිරයන්ගේ) සංස්කෘතිය තුළට සීමිත ආකාරයකින් අවශෝෂණය කෙරී ඇත. එලෙස අවශෝෂණය කෙරුණු දැනුම බටහිර සංස්කෘතික ආධිපත්‍යය තුළ අපට ම නැවත ලැබේ!

රුධිරය සංසරණය වන්නේ සත්ත්වයකුගේ සිරුරෙහි ඇති ශිරා සහ ධමනිවල ය. ශිරා සහ ධමනි නැතිව රුධිර සංසරණයක් ගැන සිතා ගත නොහැකිය. අපට ද්‍රව මාධ්‍යයක සංසරණය දැක ගත හැකි ය. අප දැන් යොදා ගන්නා සංසරණ සංකල්පය කලින් සඳහන් කරන ලද පරිදි බටහිරින් ලැබුණු එකකි. සංසරණය යන්න සීමිත circulation යන සංකල්පයට අප විසින් අද යොදා ගනු ලබන වචනය වෙයි. අපි අද ඒ සීමිත සංකල්පය තරල ගතිකයෙහි (Fluid Dynamics) මෙන් ම වඩාත් සාධාරණ ව දෛශික ක්ෂෙත්‍ර (Vector Fields) සම්බන්ධයෙන් ද යොදා ගන්නෙමු. බටහිර සංසරණයට (circulation) අවකාශයෙහි යම්කිසි පථයක් තිබිය යුතු ය. එහෙත් සිංහල සංස්කෘතියෙහි සංසරණය යන්න එයට වඩා පළල් අදහසක් ගෙන දෙයි. අපේ සංසරණයට අවකාශයෙහි ඇඳි සංවෘත පථයක් තිබිය යුතු ම නොවේ. සංසාරයෙහි සැරිසරණ සත්ත්වයන්ට අවකාශයෙහි ඇඳි සංවෘත පථ නැත. අපේ සංස්කෘතියෙහි හා අපේ භාෂාවෙහි සංවෘත පථ නොමැතිව වුව ද සංසරණය ගැන කතාකළ හැකි ය. එහෙත් ඉංගිරිසියෙහි ඇත්තේ සංවෘත පථවල කෙරෙන සංසරණයකි. ඉංගිරිසි circulation සහ සිංහල සංසරණය යනු එකක් නොව දෙකක් බව වැටහිය යුතු ය. එහෙත් අද circulation යන්නෙහි සිංහල පදය ලෙස සංසරණය යන්න යොදා ගැනෙයි. කැලණිය විශ්ව විද්‍යාලයෙහි ව්‍යවහාරික ගණිතය, භෞතික විද්‍යාව යන විෂයන්ගෙන් එකක් හෝ හැදෑරීමට තේරී ඇති සිසුන්ට මේ පිළිබඳ තවත් කරුණු දැනගැනීමට හැකිවනු ඇත.

සිංහලයෙහි (හෙළයෙහි) හා වෙනත් ප්‍රාග් වෛදික භාෂාවල සංසාරය යන වචනය හෝ වෙනත් එවැනි වචනයක් තිබීම නිසා අදාළ සංස්කෘතීන්හි ජනතාව සංසාරයක් ගැන සිතන්නට පුරුදු වී යැයි යමකු කියන්නේ නම් ඒ හුදු මනස්ගාතයක් ම පමණකි. සංසාරය යන වචනය ඒ මිනිසුන් නිර්මාණය කර ඇත්තේ තම සංස්කෘතියෙහි තිබූ යම් අදහසක් ප්‍රකාශ කිරීමට ය. ඒ අදහස ඒ මිනිසුන් ලබාගත්තේ, එනම් නිර්මාණය කර ගත්තේ කෙසේ ද යන්න අපට නිශ්චිතව ම කිවහැකි නොවේ. මිනිස් ස්වභාවයන් නිරීක්ෂණය කිරීමෙන් එවැනි සංකල්පයක් නිර්මාණය කර ගත්තා විය හැකි ය. පුනරුත්පත්තිය හෝ එයට කිට්ටු අදහස් අප්‍රිකානු ජනතාව අතර මෙන් ම බටහිර ආසියාවෙහි ද ග්‍රීසියෙහි ද ජනතාව අතර තිබී ඇත. සියළුම ප්‍රධාන ආගම්වල පාහේ ම මේ අදහස දක්නට ඇත. ක්‍රිස්තියානි හා කතෝලික ආගම්වල ද නැවත ඉපදීමක් ගැන කියැවෙයි. මිනිසා මරණයෙන් පසු අවසාන විනිශ්චයේ දී එක්කෝ

© Prof. Nalin De Silva

ස්වර්ගයට නැත්නම් සදාකාලික අපායට යැවෙයි. වෙනත් වචනවලින් කිවහොත් මිනිසා මරණයෙන් පසු එක්කෝ ස්වර්ගයෙහි නැත්නම් සදාකාලික අපායෙහි උපත ලබයි.

මෙය නැවත ඉපදීමක් නොවේ යැයි යම් කිසිවකුට කිව හැකි ය. ක්‍රිස්තියානි හා කතෝලික ආගම්වලට අනුව මිනිසාට සදාකාලික ආත්මයක් ඇති බැවින් මරණයෙන් මිනිස් ජීවිතය කෙළවර නොවන්නේ යැයි යම් කිසිවකු කීමට ඉඩ ඇත. වෛදික ආගම්වල ද සදාකාලික ආත්මයක් ඇත. එහෙත් ඔවුන්ට නැවත ඉපදීමක් ගැන කීම අපහසුවක් නොවේ. එයට එක් හේතුවක් වන්නේ වෛදික ආගම්වල එසේ නැවත ඉපදීම් රාශියක් තිබීම ය. අනෙක් හේතුව ඒ නැවත ඉපදීම් ඔස්සේ නැවත නැවතත් මිනිසුන් ලෙස ම ඉපදීමට ඇති හැකියාව ය. මියගිය මිනිසකු සදාකාලික ආත්මයක් ඇතැයි සැලකුව ද නැවතත් මිනිසකු ලෙස ඉපදුනහොත් එවිට ඇත්තේ කලින් සිටි තැනැත්තා ම නොවේ. මිනිසකු ලෙස නොඉපදී වෙනත් සත්ත්වයකු ලෙස උපත ලදහොත් තත්ත්වය තවත් බරපතල වෙයි. එවිට ඒ සත්ත්වයා කලින් සිටි මිනිසා ම යැයි කීමේ දී ගැටළු මතුවෙයි. එබැවින් සදාකාලික ආත්මයක් ගැන කියැවුන ද, නැවත ඉපදීමක් ගැන කීමට වෛදික ආගම්වලට අපහසුවක් නැත. එහෙත් ක්‍රිස්තියානි හා කතෝලික ආගම්වල තත්ත්වය තරමක් වෙනස් වෙයි. ඒ වෙනසට හේතුව ඒ ආගම්වලට අනුව මිනිසා මිය යෑමෙන් පසුව නැවතත් මේ මනුෂ්‍ය ලෝකයෙහි නුපදීම ය. එහි මිනිසා උපදින්නේ එක්කෝ ස්වර්ගයෙහි ය; නැත්නම් සදාකාලික අපායෙහි ය. එබැවින් මරණයක් හා මරණින් පසු වෙනත් එක් ඉපදීමක් හෝ ලැබුණ ද ක්‍රිස්තියානි හා කතෝලික ආගම්වල නැවත ඉපදීමක් ගැන නොකියැවෙයි.

සංස්කෘතින් අනුව සංකල්ප නිර්මාණය වෙනස් වන්නේ කෙසේ ද යන්න මේ උදාහරණයෙන් ද පැහැදිලි විය යුතු ය. සදාකාලික ආත්මයක් සහිත මිනිසා මරණයෙන් පසු වෙනත් ස්වරූපයකින් වෙනත් තැනක (ස්වර්ගයේ හෝ අපායේ හෝ) ජීවත්වීම ක්‍රිස්තියානි හා කතෝලික ආගම් උපත ලැබූ සංස්කෘතීන්හි නැවත ඉපදීමක් ලෙස නොසැලකෙයි. එහෙත් සදාකාලික ආත්මයක් (හෝ පරමාත්මය සමග එකතු නොවුණු ආත්මාංශුවක්) මරණයෙන් පසු විවිධ ස්වරූපවලින් නැවත නැවත ජීවත් වීම හා මිය යෑම වෛදික සංස්කෘතීන්හි පුනරුත්පත්තිය ලෙස සැලකෙයි. සදාකාලික ආත්මයක් ගැන කතානොකරන ථෙරවාද බුද්ධාගමෙහි පුනරුත්පත්තිය (ඇතැම් බොරු පණ්ඩිතයන්ට අනුව පුනබ්භවය) සිදුවන්නේ හේතුඵලවාදී දහමක් නිසා ය.

ප්‍රාග් වෛදික සංස්කෘතීන්හි ආත්මය යන්න සංකල්පයක් ලෙස නොතිබෙන්නට ඇත. එහෙත් සංසාර චක්‍රය හා නැවත ඉපදීම යන සංකල්ප තිබෙන්නට ඇත. කලින් සඳහන් කරන ලද ආකාරයට ඒ සංකල්ප ගොඩනැගෙන්නට ඇත්තේ මිනිස් චර්යාවන් නිරීක්ෂණය කිරීමෙන් විය හැකි ය. එසේත් නැත්නම් ධ්‍යාන වැඩූ සෘෂීන් මනස දියුණු කිරීමෙන් සත්ත්වයා සසර සැරිසරනු දැකගත්තා විය හැකි ය. ධ්‍යාන හා යෝග ක්‍රම දුර්වල කර යාග හා හෝමවලට යෑම බටහිරින් පැමිණි ආර්යයන්ගේ (වෛදිකයන්ගේ) ප්‍රතිපත්තිය විය. ඒ සමග ඔවුන් ආත්මය යන සංකල්පය ද භාරතයට හඳුන්වා දෙන්නට ඇතැයි සිතිය හැකි ය. ආත්මය භාරතයට පැමිණියේ බටහිර ආසියාවෙන් විය යුතු ය. ඒ ආත්ම සංකල්පය භාරතයේ තිබූ පුනරුත්පත්ති සංකල්පය සමග මිශ්‍ර කර භවයෙන් භවයට ගමන්කරන ආත්මය හා ඒ සමග බ්‍රහ්මන් හා පරමාත්ම සංකල්ප නිර්මාණය කිරීමට වෛදික සංස්කෘතියක් භාරතයේ නිර්මාණය කළ බ්‍රාහ්මණයන් සමත් වී ඇති බව චින්තන විකාශය ඔස්සේ පැරණි භාරතය දෙස බලන කල පෙනී යයි.

ඉහත සඳහන් අන්දමේ බැරෑරුම් සංකල්පයක් නොවුණ ද සුදු පාටට අපේ ඇති කැමැත්ත ද, සුදු පාට කළු පාටට වඩා උසස් ලෙස සැලකීම ද භාරතයට බටහිරින් පැමිණි පිරිස් විසින් ඇති කරන ලද්දක් බව පෙනී යයි. භාරතයට ආර්යයන් පැමිණීමට පෙර එහි සිටියෝ කාල වර්ණ වූහ. මෙහි දී නැවත නැවත අවධාරණය කළ යුතු කරුණක් වනුයේ ආර්යයන් (වෛදිකයන්) පැමිණීමට පෙර භාරතයේ සිටිය ජනයා ද්‍රවිඩයන් නොවූ බව ය. ද්‍රවිඩයන් භාරතයට පැමිණ ඇත්තේ ක්‍රිස්තු පූර්ව පන්සියයේ දී පමණ ය. ඒ වන විටත් ආර්යයන් එවකට පැවති ප්‍රාග් වෛදික සංස්කෘතිය සමග මිශ්‍ර වී වෛදික සංස්කෘතියක් බිහි කර අවසාන ය. ආර්යයන් භාරතයට පැමිණීමට පෙර එහි විසූ ජනතාව ආර්ය හෝ ද්‍රවිඩ හෝ නොවූහ. අනාර්ය යන්නෙන් අනිවාර්යයෙන් ම ද්‍රවිඩ යන්න ගම්‍ය වේයැයි සිතීම වැරදි ය.

භාරතයට බටහිරින් පැමිණි ආර්යයෝ සුදු පැහැති සමක් ඇති අය වූහ. ආර්ය ආධිපත්‍යය (ඇත්තට ම වෛදික ආධිපත්‍යය) භාරතය පුරා පැතිරයත් ම සුදු පැහැයේ ප්‍රධානත්වය ද වෛදික සංස්කෘතිය තුළ ඉදිරියට ගෙන ඒමට

© Prof. Nalin De Silva

බමුණන් සමත් වී ඇත. බමුණෝ වර්ණ භේදයක් ඇති කළහ. භාරතයේ කුල ක්‍රමය මුලින් ම පැන නැගුණේ බටහිරින් පැමිණියවුන්ගේ ආධිපත්‍යය හේතුකොටගෙන ය. ඔවුහු තම වර්ගය, තම සුදු වර්ණය ආදිය උසස් බවට සම්මතයක් භාරතය පුරාම ඇති කිරීමට කටයුතු කළහ. මේ නිසා සුදු හමක් ඇති අය උසස් ලෙසත් කළු හමක් ඇති අය පහත් ලෙසත් සමාජයේ සැලකිණි. යම් අයුරකින් ආර්යයන් කළු වී ඔවුන් භාරතයට පැමිණෙන විට එහි සුදු හම ඇතියවුන් සිටියේ නම් වෛදික ආධිපත්‍යය භාරතය පුරා පැතිර යත් ම කළු උසස් ලෙස සැළකෙනු නොඅනුමාන ය.  එවිට සුදු පහත් වෙයි. එසේ වූ සමාජයක “අපි කළු” දැයි අසනවා වෙනුවට  “අපි සුදු” දැයි  ඇසීමට තිබුණි. සුදු උසස් කර සළකමින් කළු පහත් කිරීම අවුරුදු පන්සියයකට පෙර යුරෝපීයයන් භාරතයට හා ලංකාවට පැමිණීමෙන් පසු තවත් තීව්‍ර වන්නට විය. දැන් අපට සුදු පාටට වඩා පාටක් නැත. සුදු පිරිසිදු කමේ ද පාට ය. මෙය පසුගිය අවුරුදු පන්සියය තුළ තවත් තහවුරු වුණු අවුරුදු තුන් භාරදාහක සුදු ආධිපත්‍යයක්  හරහා ගලා එන්නකි.

අප සමාජය විසින් සුදු උසස් ලෙස සැලකෙන්නේ භාෂාවෙන් එවැන්නක් හැඟවෙන නිසා නොවේ. සුදු යන වචනය කළු යන වචනයට වඩා උසස්වන ලෙස කිසිවකු විසින්වත් වචන නිර්මාණය කෙරී නැත. වත්මන් සිංහලයන් සුදු උසස් ලෙස සලකන්නේ භාෂාව එසේ කියන නිසා නොවේ. එය භාෂාව ඉක්මවූ සංස්කෘතික ලක්ෂණයකි. සංස්කෘතික ආධිපත්‍ය දෙකක් හේතුකොටගෙන අද එය සිදුවන බවට සැකයක් තිබිය හැකි නොවේ. මේ ආධිපත්‍ය වෛදික ආධිපත්‍යය හා බටහිර යුරෝපීය  සංස්කෘතික ආධිපත්‍යය වෙයි. වෛදිකයන් භාරතය පුරා ආධිපත්‍ය පැතිරවීමට පෙර ද සුදු හා කළු අරුත දෙන වචන ප්‍රාකෘත භාෂාවල තිබුණු බව නිසැක ය. එහෙත් සුදු හා කළු අතර ධුරාවලික සම්බන්ධයක් තිබුණේ ද නැත් ද යන්න දැන ගැනීමට හැකි ක්‍රමයක් නැත. එසේ තිබුණ ද අපට නිසැකයෙන් ම ප්‍රකාශ කළ හැක්කේ එවැනි ධුරාවලියක සුදු ඉහළින් ම නොසිටි බව ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva